# දශකුමාර චරිතයට ප්‍රවේශයක්

කේ බී ජයවර්ධන

Sanskrit critics believe that Dandin is a great poet, and an intelligent creative writer. Tradition says that Dandin was patronised by the Pallava kings of Kanchi in 7th century CE. Dandin has mentioned by Bhoja and referred to yavanas, therefore some scholars like prof. Wilson places him at the end of 11th century, but it may be noted that the term yavanas is mentioned in Raghuvamsam and Mudrarakshasa also, where it refers to Greeks derived from Ionia. Regarding the reference to king Bhoja, Sanskrit literature has mentioned this name in different time-periods. This seems to be a popular name, and as such every time we can't talk Bhoja to be the Paramar king of Malawa. Tradition sometimes places Dandin and Kalidasa in the same period and make the compete with each other.

සංස්කෘත කාව්‍යයේ ගද්‍ය පද්‍ය හා චම්පු කාව්‍යයන් අතර විශිෂ්ට ස්ථානයක් ගද්‍ය කාව්‍යයක් වන දශකුමාර චරිතයට හිමි ව තිබේ. රමණීය අර්ථයක් හා රසය උද්දීපනය වන නිර්මාණ පද්‍ය වුව ද ගද්‍ය වුව ද කාව්‍ය නාමයෙන් ආලංකාරිකයෝ හඳුන්වති. පද්‍ය කාව්‍යයන් හා සලකා බැලීමේ දී ගද්‍ය කාව්‍ය නිර්මාණ ඉතාමත් අල්ප ය. සම්භාව්‍ය සංස්කෘත සාහිත්‍යයේ ගද්‍ය ග්‍රන්ථ කිහිපයක් පමණක් හමුවේ. ඒ අතර පහත දැක්වෙන නිර්මාණ විශේෂත්වයක් දරයි.

1. කාදම්බරී
2. දශකුමාරචරිත
3. හර්ෂචරිත
4. වාසවදත්තා
5. තිලකමඤ්ජරී
6. ගද්‍යචින්තාමණී
7. භට්ටාර හරිචන්ද්‍ර ගද්‍ය කාව්‍ය
8. තරඞ්ගවතී
9. ත්‍රෛලොක්‍ය සුන්දරී
10. ශ්‍රී කෘෂ්ණචරිත

ගද්‍ය කාව්‍ය නිර්මාණය අල්පවීමට පහත දැක්වෙන හේතුන් බලපාන්නට ඇතැයි විචාරකයෝ පවසති.

- ★ පද්‍ය කාව්‍යයට මෙන් ගද්‍ය කාව්‍යයට පාඨකයා රුචි නොකිරීම.
- ★ කණට මිහිරි රසයක් ගෙන නොදීම.
- ★ පද්‍ය රචනයේ දී පද්‍ය නිර්මාපකයාට රචනයේ නිදහස හිමි වීම.
- ★ ගද්‍ය නිරන්තරයෙන් ම ව්‍යාකරණානුකූල ව ම රචනා කළ යුතු වීම.
- ★ කවිත්ත්වය ප්‍රකට කරවීමේ භාග්‍යය නොමැති වීම.

මහාකවි භාරවිගේ මධ්‍යම පුත්‍රයා වූ මනෝරථට පුත්තු සතරදෙනෙක් සිටියහ. ඔවුන්ගෙන් අන්තිමයා වූ වීරදත්ත විශිෂ්ට විද්වතෙක් විය. ඔහුගේ භාර්යාව ගෞරී නම් වූවා ය. වීරදත්ත හා ගෞරී යන දෙදෙනාගේ පුතා දණ්ඩීන් විය. ඔහුගේ බාලකාලයේ දී ම දෙමාපියෝ දිවංගත වූහ. එබැවින් ඔහු හුදකලාව වැඩුණේ ය. කාඤ්චිපුරය ඔහුගේ ජන්ම භූමිය විය. විදර්භයට සම්බන්ධ ප්‍රදේශයකි. ඒ බව මහාරාෂ්ට්‍ර භාෂාව හා වෛදර්භ රීතිය පිළිබඳ ඔහුගේ කැමැත්තෙන් ම පැහැදිලි වේ. මොහු සන්‍යාසියකු නොවූ අතර විෂ්ණු භක්තිකයෙක් විය. බ්‍රාහ්මණ පරිසරයක දී අධ්‍යාපනය ලබා ගත්තේ ය. කාඤ්චි පල්ලව රජ සෙවනෙහි ඔහුගේ සුවදායක දිවිය ගෙවුණි.

දණ්ඩීන්ගේ කාලය ක්‍රි.ව. හයවන ශත වර්ෂයේ අවසන් භාගය හා හත්වන ශත වර්ෂයේ පූර්ව භාගය ලෙස බොහෝ උගත්හු පිළිගනිති. එමෙන් ම බාණ හා සුබන්ධු යන කවීනට පෙර විසූවකු සේ සලකති. මහාකවි දණ්ඩීන් විසින් ග්‍රන්ථ තුනක් රචනා කරන ලදැයි පිළිගැනේ. එයින් දශකුමාරචරිත හා කාව්‍යාදර්ශ ඔහුගේ ම කෘති යැයි අවිවාදයෙන් පිළිගනිති. අවන්තිසුන්දරී කථාවේ කර්තෘත්ත්වය පිළිබඳ මතභේද තිබුණ ද එය ද අප කතුවරයාගේ යැයි පිළිගනිති. ඒ බව රාජශේඛර කවියා විසින් -

''ත්‍රයෝ'ග්නයස්ත්‍රයො දෙවාස්ත්‍රයො වෙදාස්ත්‍රයො ගුණාඃ
ත්‍රයො දණ්ඩිප්‍රබන්ධාශ්ච ත්‍රිෂු ලොකෙෂු විශ්‍රුතාඃ''

අග්නි තුනකි. දෙවියෝ තිදෙනෙකි. වේද තුනකි. ගුණ තුනකි. දණ්ඩින්ගේ ප්‍රබන්ධ තුනකි. යැයි තුන් ලොවෙහි ප්‍රසිද්ධ ය. යනුවෙන් දක්වා ඇත.

සංස්කෘත කාව්‍ය ලොවේ කලාත්මක ම කලාව නිර්මාණය කිරීමේ දී දණ්ඩීන් කවියා අද්භූත අපූර්ව හැකියාවක් ලබාගත්තේ ය. ශබ්ද රාජ්‍යයේ සාර්ථක ම රජු කවි දන්ඩීන් යැයි සලකති. දශකුමාරචරිතයෙහි යොදා ඇති ආනුප්‍රාසික පදවින්‍යාසය අතිශය දැකුම් කලු ය. ලලිත පදයන්හි ශෘංඛලාබද්ධ සංස්ථාපනයේ විලක්‍ෂණ දශකුමාරචරිතය පුරාවට ම දක්නට ලැබේ. එමනිසා ම සංස්කෘත සාහිත්‍යයේ පදලාලිත්‍යයේ දක්‍ෂතමයා දණ්ඩීන් ය. ඒ බව ''දණ්ඩිනඃ පදලාලිත්‍යම්'' යනුවෙන් දක්වා ඇත. දශකුමාරචරිත අධ්‍යයනයෙන් ආචාර්ය දණ්ඩින් ව්‍යවහාරික සංස්කෘත භාෂාව භාවිත කළ නිර්මාණ කරුවකු බව පැහැදිලි වේ. ඔහුගේ ගද්‍ය ශෛලිය සරල

ය. ප්‍රසාද ගුණයෙන් යුක්ත ය. භාෂාව ආයාසයකින් තොර ව ස්වභාවික ව ගලා යන අතර නිසි තැන උචිත පද යොදා ඇත. දීර්ඝ පද වින්‍යාසයකින් තොර වීම නිසා පාඨක සිත සතුටට පත් කරයි. ගද්‍ය රචනයේ දී ක්ලිෂ්ට පද යෝජනය දක්නට නොලැබේ. ඔහුගේ ගද්‍ය ශෛලිය ශිෂ්ට මෙන් ම සංයමයෙන් යුක්ත ය. අනුප්‍රාසමය පද වින්‍යාසය ඔහුගේ පදලාලිත්‍යයට ප්‍රධාන ම හේතුවයි. ආනුප්‍රාසික චමත්කාරය සමග ම යමක යෙදීම අතිශයින් ම මනහර ය. ''නියතිබලාන්නු තත්පාටවාන්නු ස්වබුද්ධිමාන්‍යාන්නු'' (දශකුමාර චරිත 2 උච්ඡ්වාස), ක්‍රන්දත්සු පරිජනෙෂු, රුදත්සු සඛීජනෙෂු, ශොචත්සු පෞරජනෙෂු (දශ.5.උච්ඡ්) මෙවැනි ගද්‍ය ඛණ්ඩවලින් ඔහුගේ ශබ්ද ශිල්පයේ විචිත්‍රත්වය දෘෂ්ටිගෝචර වේ.

## දශකුමාර චරිත ගද්‍ය කාව්‍යය

දන්ඩීන්ගේ රචනා ශෛලිය හුදු කාව්‍යයමය නොවන අතර එය ශාස්ත්‍රීය කාව්‍ය රචනයක මාර්ගය පෙන්නුම් කරයි. ඔහුගේ බස ඉතා සරල ය. සුකුමාල ය. බෝධනීය හෙවත් පැහැදිලි ය. දණ්ඩින් සංස්කෘත කාව්‍යශෛලියේ සංක්‍රාන්ති අවධියට අයත් අයකු බව සුපැහැදිලි ය. සරලත්වයේ සිට දුෂ්කර හා සංකීර්ණත්ව දක්වයි. ඔහුගේ රචනය වාසවදත්තා හා කාදම්බරී යන කථාවල රචනයන්ට වඩා පඤ්චතන්ත්‍ර හා කථාසරිත්සාගර කථාකලාවට බෙහෙවින් ම සමාන ය. මෙම ග්‍රන්ථ තුන සසඳා බැලීමෙන් පැහැදිලි වේ.

ග්‍රන්ථාභ්‍යන්තර සාධකවලට අනුව චාරිත්‍ර-වාරිත්‍ර සියල්ල හින්දු ධර්මය නිරූපණය කරයි. එමගින් භාරතීය පෞරාණික ආර්ථික, දේශපාලනික හා සමාජ පසුබිම නියෝජනය කරන චරිත නිරූපණය කොට ඇත. මුස්ලිම්වරුන් විසින් භාරතය ආක්‍රමණය කිරීම පිළිබඳ තොරතුරු ද හමුවේ. කාමන්දකී විසින් අනුගමනය කළ චාණක්‍ය නීති සියල්ල ම දශකුමාරයේ නිරූපිත කුමාරවරු අනුගමනය කළහ. චෞර කලාව හා සූදුව මෙම කුමාරවරුන්ගේ අධ්‍යාපනයේ කෙටසක් වූ බව පැහැදිලි ය. මෙසේ තත්කාලීන සමාජය යථානුරූපීව නිරූපණයේ දී මෘච්ඡකටික කතු ශූද්‍රක කවියාට පසුවත් භවභූති හා විශාඛදත්තට පෙරත් විසූ විශිෂ්ටතම කවියෙකි.

මෙම කෘතිය කියැවීමෙන් භාරතීය තත්කාලීන සමාජය පිළිබඳ වැදගත් තොරතුරු අධ්‍යයනය කළහැකි ය. එහි දී භාරතයේ අඳුරු යුගයක ඉතිහාසය, සිරිත් විරිත්, රාජ්‍ය පාලනය, සමාජයේ පැවැත්ම, මානව සිතුම් පැතුම් ප්‍රධාන ලෙස හඳුනා ගත හැකි ය. සංස්කෘත භාෂා අධ්‍යයනයට පහසු මාර්ගයක් මෙම නිර්මාණයෙන් උදා වී ඇත. සංකීර්ණ කථා කිහිපයක් එක ම කථාවක් තුළට ගොනු කොට ඇත්තේ විචිත්‍රවත් ලෙස ය. කථාව රසවත් කිරීමට මෙන් ශෘඞ්ගාර රසය මෙන් ම අනෙක් රසයන් ද මනා පරිචයකින් යුක්ත ව යොදා ගෙන ඇත.

කවි යන වචනය භාවිත කිරීම සම්බන්ධයෙන්

''ජාතෙ ජගති වාල්මීකෞ කවිරිත්‍යභිධාභවත්.
කවී ඉති තතො ව්‍යාසෙ කවයස්ත්වයි දණ්ඩිනි''.

දක්වා ඇති පාඨයෙන් ලොවෙහි කවි යන නාමය ලද පළමු වැන්නා වාල්මීකි වන අතර දෙවැන්නා ව්‍යාසත් තෙවැන්නා දන්ඩීන් බවත් දක්වයි. එමෙන් ම කවි ශබ්දයේ කවිඃ, කවී, කවයඃ යනුවෙන් කවි ශබ්දයේ ඒකවචන, ද්විවචන හා බහුවචන නිර්මාණයට මෙම කවීන් තිදෙනා හේතු වූ බව ද කියැවේ. එසේ ම භාරතයේ බිහි වූ තෙවන කවියා දන්ඩීන් බව ද ප්‍රකාශ කරයි. කාලිදාස, බාණ හා භවභූති මෙන් ම දණ්ඩින් ද භාෂාභාවිතයේ නිපුණයෙකි. ඒ බව ඔහු විසින් ඔෂ්ඨජ අක්ෂරවලින් තොර ව ඉතාමත් සාර්ථක ලෙස හත්වන උච්ඡ්වාසය සම්පූර්ණයෙන් නිම කිරීමෙන් පැහැදිලි ය. තම රචනයේ දී සෞන්දර්යාත්මක වචන යෙදීමෙහි ප්‍රසිද්ධ වූවෙකි. රසනිෂ්පත්තිය, විචිත්‍ර කථා ශෛලිය, මධ්‍යස්ථ පැහැදිලි කිරීම් යන අංශවල දී වෙනත් කිසිවෙකු හා සමකළ නොහැකි පරිදි විශිෂ්ටතා දැක් වූවෙකි.

ස්වභාව සෞන්දර්යයෙන් පිරිපුන් ව්‍යක්ත කවිත්වයෙන් ආඪ්‍ය කවියෙක්වන දන්ඩීන් කාව්‍ය වර්ණනා ශක්තියෙන් අනූන වූවෙකි. රාජවාහන හා අවන්තිසුන්දරී ප්‍රථම හමුව, ප්‍රමති නොදන්නා කුමාරවරුන්ට සිය බලය පෙන්වීම, කන්දුකාවතීගේ බෝල සෙල්ලම යන අවස්ථා වර්ණනාත්මක කාව්‍ය නිර්මාණයට නිදසුන් ලෙස දැක් විය හැකි ය. දශකුමාරචරිතයේ අපහාරවර්මන් කථා පුවත විවිධ සිඳුවීම් හේතුකොට ගෙන සාර්ථක ම නිර්මාණය ලෙස හැඳින් විය හැකි ය.

ඉතාමත් දියුණු ශෛලියකින් දශකුමාර චරිතය ලියා ඇත. භාෂාව විෂයයට අනුගතව යොදාගෙන ඇත. එය සාමාන්‍ය පාඨකයාටත් අවබෝධ කොට ගත හැකි ය. සුකුමාල ය. අවශ්‍ය ස්ථානයන්හි නිසිපරිදි අනායාසයෙන් නිසි වචන යොදා ඇත. එයින් කවියට උචිත පද ගලපා ඇත. මහාචාර්ය විල්සන් මහතා පවසන පරිදි මෙතෙක් ඉඳුල් නොවූ සිඳුවීම් සිය නිර්මාණයේ වස්තු බීජ වශයෙන් යොදා ගෙන තිබේ. එය නව නිර්මාණයක් සාර්ථක වීමට බෙහෙවින් ම බලපායි.

දණ්ඩින්ගේ දශකුමාර චරිතය කර්තෘ විසින් අවසන් කරන ලද්දක් ලෙස පිළිගත නොහැකි ය. නිසි ආරම්භයකින් තොර ව එක්වර ම ආරම්භ වූවකි. කථාවේ එන කුමර-කුමරියන් හඳුන්වාදෙමින් අරඹා විශ්‍රැත කථාව අවසන් නොකොට ම සිය නිර්මාණය නිම කරයි. මේ නිසා දශකුමාරචරිතයේ මෙම අඩුව සම්පූර්ණ කිරීමට එකිනෙකට සම්බන්ධ නොවන හැකියාවන් දෙකක් ඇති පුද්ගලයන් දෙදෙනෙකු විසින් පූර්වපීඨිකාව හෙවත් හැඳින්වීම ද කථාව අවසන් කිරීමේ අරමුණින් උත්තරපීඨිකාව ද රචනා කොට තිබේ. මෙයින් පූර්වපීඨිකාව ප්‍රධාන කථාවට සම්බන්ධ නොවුව ද බෝධනීය හා ඕජෝ ගුණයෙන් යුක්ත ව කථාවට වඩාත් සමීප වන පරිදි රචනා කොට ඇත. එය දන්ඩීන් ආචාර්යවරයාගේ ශිෂ්‍යයකු විසින් රචනා කරන්නට ඇතැයි සිතිය හැකි ය. ඔහුගේ නම අමතක විය යුතු බැවින් ඇතුළත් කරන්නට නැත. මෙම කොටස දන්ඩීන්ගේ නොවන බවට එහි යොදා ඇති භාෂා ප්‍රයෝග ම ප්‍රමාණවත් සාක්ෂි සපයයි. අනවශ්‍ය දීර්ඝ විස්තර හා ආදේශක වචන භාවිතය දන්ඩීන්ගේ ශෛලියට අනුගත නැත. උත්තරපීඨිකාව හෙවත් උපග්‍රන්ථය ප්‍රධාන කොටස් දෙකට ම වඩා අශාස්ත්‍රීය නිර්මාණයකි. මේ අනුව දශකුමාර චරිතය කොටස් තුනකින් යුක්ත බව ප්‍රකට ය. එම කොටස් තුනෙන් උච්ඡ්වාස සහිත පූර්වපීඨිකාවත් උච්ඡ්වාසවලින්

තොර උත්තරපීඨිකාවත් දන්ඩීන් ආචාර්යවරයාගේ නොවන බවත් මධ්‍ය කොටස හෙවත් දශකුමාර චරිත නම් වූ උච්ඡ්වාස අටකින් යුත් කොටස පමණක් දන්ඩීන් ආචාර්යවරයාගේ බවත් විචාරක මතයයි. මෙයට අමතර ලාංකේය සමහර විද්වත්හු මුළු ග්‍රන්ථය ම දන්ඩීන් ආචාර්ය වරයාගේ නිර්මාණයක් බවට කරුණු ඉදිරිපත් කරති. මේ පිළිබඳ නිගමන මුළු ග්‍රන්ථාධ්‍යයනයෙන් ම ගනිත්වා. සංස්කෘත ගද්‍ය සාහිත්‍යයේ රසවත් ම කෘතිය දශකුමාරචරිත බව අවිවාදයෙන් ම පිළිගනියි.

මෙම කථා විකාශය සඳහා යොදාගෙන ඇත්තේ ඉතාමත් සරල කථා වස්තුවකි. රාජහංස රජුගේ අවාසනාවන්ත සමයක ඔහුට උපන් කුමරා භාග්‍යශීලි අයකු ලෙසත් මිතුරන් නව දෙනා ශූර-වීරකම්වලින් අනූන බවත් බෙදී පැවැති භාරතය ඒකීය රාජ්‍යයක් කළ අයුරුත් දශකුමාරවරුන්ගේ ආවාහ විවාහ කටයුතු සිදුවීමත් යන කරුණු මුල් කොට ගෙන කථාව විකාශනය කොට ඇත. මෙවන් සුළු වස්තු බීජයක් මහා වෘක්ෂයක් බවට පත්කරමින් රසවත් නිර්මාණයක් ශ්‍රී දන්ඩීන් කවියා විසින් පාඨක හදවත් රසාලිප්ත කිරීමට සමත් අයුරින් ඉදිරිපත් කොට තිබේ.

චරිත නිරූපණයේ දී සමාජයේ කලු හෙවත් දුශ්චරිත සිය නිර්මාණයට යොදා ගෙන ඇත. එහි දී සමාජයේ පැවැති චරිත පිළිබඳ විවේචනයක් ඔහු ඉදිරිපත් නොකරයි. බොහෝ දුරට සෑම මානවයෙක් ම සිය සිතුම් පැතුම් ඉටු කර ගැනීමේ දී ක්‍රියාව හොඳ හෝ නරක යැයි නොසලකා අරමුණ ඉටු කර ගැනීමට ප්‍රයත්න දරයි. අප කතුවරයා චරිත පිළිබඳ සිය මතය ප්‍රකාශ නොකරමින් ඒවායේ ස්වභාවය එම අයුරින් නිරූපණය කරයි. විශිෂ්ටතම චරිත නිර්මාණය වන අපහාරවර්මන් චරිතය අතුරු කථා කිහිපයක් සමග ම සම්න්ධ කොට ප්‍රධාන කථාවට ගළපයි. දුෂ්ට සමාජයේ ඉහළ ම ස්තරවල ක්‍රියාකාරිත්වය පාඨක සිතෙහි චිත්‍රණය කිරීමේ කුශලතාවක් දන්ඩීන් කවියා සතු පැවැති බව පැහැදිලි ය.

සමාජයේ බරපතල ගණයේ අපරාධවල මූලිකත්වය දරන්නේ රාජ්‍ය තන්ත්‍රය හා සම්බන්ධ රජ, ඇමැති, මැති පුතුන් ය. ඒ බව මෙම කුමාර චරිත අධ්‍යයනයෙන් ප්‍රකට වේ. රාජ්‍ය තන්ත්‍රයට සම්බන්ධ පාලකයන් කිසි ම හිරිකිතයකින් තොර ව දූෂිත හා දරුණු ගණයේ අපරාධවල නිරත වීම ඉදිරිපත් කොට ඇත්තේ තත්කාලීන සමාජ විද්‍යාඥයකුගේ දෘෂ්ටි කෝණයෙන් වුව ද එය සර්වකාලීන හා සර්ව දේශජ වේ.

අපහාරවර්මන් චරිතයෙන් ධනවතා ද සුරූපී තැනැත්තා ද ශ්‍රේෂ්ඨ යන ප්‍රශ්නය ජනතා විනිශ්චය සභාවට ඉදිරිපත් කරමින් ගොඩ නගා ඇත. කාමමඤ්ජරී යන නාමයෙන් ගණිකාවකට සමාජයේ හිමි තැන පෙන්වා ඇත. ගණිකා වෘත්තියයේ නිරත වන්නන්ගෙන් ඔවුන්ගේ ජීවන රටාව කාමුක ලොවේ කෙතරම් සාර්ථක දැයි කිව හැකි ය. කාමමඤ්ජරීට ද එදා සමාජයේ උසස් සමාජ මට්ටමක් මෙන් ම ප්‍රභූ ඇසුරක් ඉතාමත් ඉහළින් ම පැවැතිණ. තුන් කල් දන්නා මරීචි වැනි සමාජ ශෝධකයන් ඇය වසඟයට පත් ව ඇත. එමෙන් ම ධර්මරක්ෂිතා නම් භික්ෂුණියක මුදල් පසුම්බියක් සොරකම් කිරීමට යොදා ගැනීමෙන් කාමමඤ්ජරී හා ඇය අතර සම්බන්ධයත් බලය හමුවේ තම අවශ්‍යතාවන් ඉටුකර ගැනීමට ඕන ම පුද්ගලයකු යොදා ගත හැකි බවත් පෙන්නුම් කරයි.

වස්තු විකාශනයේ දී අද්භූත සිදුවීම් ද යොදා ගෙන ඇත. ඊශ්වරගේ ගදායුධ ප්‍රහාරයෙන් රාජවාහන සිහිසුන් වීම, සිය හිමියා මළේ යන හැඟුමෙන් සිය දිවි නසාගැනීමට තැත් කරන අවස්ථාවේ අහඹුලෙස අශ්වරථය පැමිණීම, පුෂ්පෝද්භවගේ උත්පත්තිය, ඉදිබුවකුගේ වෙසින් පැමිණි මිනිස් රූපය, රකුසකු විසින් කන්දුකාවතී පැහැර ගෙන යාම, යුද්ධයේ දී අහසින් වැටෙන මිත්‍රගුප්ත වැටීමට නොදී අල්වා ගැනීම වැනි අස්වාභාවික අවස්ථා නිරූපණ ද ඇත.

මෙවන් සිද්ධීන් කිහිපයක් පැවැතිය ද ස්වභාවික සිදුවීම්වලින් ගහණ ය. නගරෝප වනයෙහි දී බාලචන්ද්‍රිකාගේ සහායෙන් රාජවාහනට අවන්තීසුන්දරී මුණගැස්වීම අති තාත්වික අයුරින් නිරූපිත ය. රාජවාහන අවන්තීසුන්දරී හමුව සුදුසු ස්ත්‍රියකගේ කාමුක පුරුෂයකුගේ හමුවක් ලෙස සුන්දර ආකාරයෙන් ඉදිරි පත්කොට ඇත. ප්‍රමති චරිතයේ බමුණාගේ ශඨ කපට ප්‍රයෝග පාඨක සිතට සිනහව උපදවයි. නිම්බවතී, නිතම්බවතී හා ගෝමිනී චරිත ස්ත්‍රී චරිතයේ විවිධ පැතිකඩ ප්‍රතිබිම්බනය කරයි.

දශකුමාරයන්ගේ චරිතවලින් රාජවාහන කථාවට නිසි ආරම්භයක් හා අවසානයක් ලබා දී ඇත. කථාවක් අවසන් වීමට පෙර අනෙක් කථාවේ ආරම්භය ඉදිරිපත් කරමින් පැරණි කථා කියන්නන්ගේ ක්‍රමය අනුගමනය කොට තිබේ. කථා සන්දර්භයට මූලිකත්වය දෙමින් දන්ඩීන් ආචාර්යවරයා සිය නිර්මාණය විද්වද්ලොව හමුවේ තබයි.

## දශ කුමාරයෝ :

1. රාජවාහන - මගධාධිපති රාජහංසගේ පුත්
2. සෝමදත්ත - රාජහංසගේ පූර්ව ඇමැති වූ සිතවර්මන්ගේ පුතා වූ ද සුමතිගේ සහෝදරයා වූ ද සත්‍යවර්මන්ගේ පුත්
3. පුෂ්පෝද්භව - දවන ඇමැති වූ පද්මෝද්භවගේ පුතා වූ ද සුශ්‍රැතගේ සහෝදරයා වූ ද රත්නෝද්භවගේ පුතා
4. අපහාරවර්මන් - (රාජහංසගේ මිතුරා වූ මිථිලාධිපති ප්‍රහාරවර්මනගේ පුත්තු)
5. උපහාරවර්මන්
6. අර්ථපාල - පැරණි ඇමැති වූ ධර්මපාලගේ පුතා වූ ද සුමිත්‍රගේ සහෝදරයා වූ ද කාමපාලගේ පුතා
7. ප්‍රමති - සිතවර්මන්ගේ පුතා වූ ද සත්‍යවර්මන්ගේ සහෝදරයා වූ ද සුමතිගේ පුතා
8. මිත්‍රගුප්ත - පැරණි ඇමැති වූ ධර්මපාලගේ පුතා වූ ද සුමිත්‍රගේ සහෝදරයා වූ ද සුමන්ත්‍රගේ පුතා
9. මන්ත්‍රගුප්ත - පැරණි ඇමැති වූ ධර්මපාලගේ පුතා වූ ද සුමන්ත්‍රගේ සහෝදරයා වූ ද සුමිත්‍රගේ පුතා

10. විශ්‍රැත - පද්මෝද්භවගේ පුතා වූ ද රත්නොද්භවගේ සහෝදරයා වූ ද සුශ්‍රැතගේ පුතා

## දශකුමාර චරිත

### රාජවාහන - පළමුවන උච්ඡ්වාසය.

රාජවාහන අවන්තිසුන්දරී දෙදෙනාට දිනක් සීනෙන් නෙලුම් හුයකින් පයෙහි බැඳි හංසයෙක් පෙනුණි. නින්දෙන් අවදි වූ අවන්තිසුන්දරී සිය සැමියාගේ දෙපා බැඳ ඇති බව දැක විලාප දුන්නා ය. යෙහෙළියෝ ද ඇය අනුව හැඬූහ. ආරක්ෂකයෝ චණ්ඩවර්මන් රජුට මේ ප්‍රවෘත්තිය දැනුම් දුන්හ. චණ්ඩවර්මන් රජු රාජවාහනට හා අවන්තිසුන්දරීට නින්දා කළේ ය. "හංසකථාව සිහිකරමින් දෙමසක් ඉවසන්න සොඳුරිය"යි රාජවාහන හඬන අවන්තිසුන්දරීට කීවේ ය. රජයෙන් විශ්‍රාමගත් මානසාර හා බිසවගේ ඉල්ලීම නිසා රාජවාහන මරණයට පත් නොකොට සිර ගතකළේ ය. චණ්ඩවර්මන් රජු අම්බාලිකා කුමරිය බලයෙන් ලබා ගැනීමට සිංහවර්මන් රජුට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කොට චම්පා නුවර වටලා සිංහවර්මන් ජීවග්‍රහණයෙන් අල්ලා ගත්තේ ය. පසුදින ඇය හා විවාහ මංගල්‍යය සිදු කිරීමට නියම ව තිබෙද්දී දර්පසාරගේ නියෝගය අනුව සිරකළ රාජවාහන **චණ්ඩපෝත** මතැතු ලවා මැරවීමට අන්තඃපුරයට ගෙනාවේ ය. මේ අවස්ථාවේ දී රාජවාහනගේ දෙපා බැඳ තිබුණු ලණුව තමා විසින් ම ඉවත් කොට ඒ තත්ත්වයෙන් සිටි සුරතමඤ්ජරී තමාට සිදු වූ ශාපකථාව විස්තර කොට ක්ෂමා කරවා කළ යුත්ත විචාළා ය. රාජවාහන මේ ප්‍රවෘත්ති සියල්ල අවන්තිසුන්දරීට කියන සේ ඇයට නියෝග කළේ ය. මෙවිට කිසියම් සොරෙකු අම්බාලිකාවගේ අත ගැනීමට සූදානම් වූ චණ්ඩවර්මන් සහ ඔහුගේ සිය ගණන් වූ පිරිස මරා දමමින් සිටිති යි ජනප්‍රවාදයක් විය. ඒ ඇසූ රාජවාහන මතැතු පිටට නැඟී ඒ වීරපුරුෂයා අපහාරවර්මන් ද නංවා ගත්තේ ය. මොවුනට විරුද්ධ ව ආ සතුරන් මරමින් ඉදිරියට **ධනමිත්‍ර** මෙහෙය වූ යුද සෙනඟ පැමිණියේ ය. රාජවාහන රජුට සිය මිතුරා හඳුන්වා දී ඔහුගේ අනුමතියෙන් සිංහවර්මන් කැඳෙව්වේ ය. රාජවාහන රජු අපහාරවර්මන් සමඟ ගොස් නුග ගසක් යට වාඩි විය. මෙහි දී තම මිත්‍ර කුමාරවරුන්ට සිය නායක රාජවාහන රජු හමුවිය. ප්‍රීතිමත් ව අපහාරවර්මන්ට සිය තොරතුරු කීමට අණ කෙළේ ය.

### අපහාරවර්මන් - දෙවන උච්ඡ්වාසය.

අපහාරවර්මන් මරීචි මුනිවරයාගේ දිව්‍යඥානයෙන් රාජවාහන සිටින ස්ථානය දැන ගැනීමට චම්පා නගරයෙහි ගං ඉවුරට ගියේ ය. කලකිරුණු තවුසකු දැක ඔහුගෙන් මරීචි ඍෂිවරයාගේ තොරතුරු විචාළේ ය. එහි දී මරීචි ඍෂිවරයා, කාමමඤ්ජරී නම් ගණිකාව සිය මෑණියන් හා පිරිවර සමග මෙහි පැමිණ වන වාසයට අවසර ඉල්ලූ බවත් මරීචි මුනිවරයා එය වැළැක්වීමට උත්සාහ කළමුත් ගින්නට පැන දිවිනසා ගැනීමට සූදානම් වූ නිසා වනවාසයට ඉඩ දී මෑණියන් සහිත පිරිවර ආපසු පිටත් කළ බවත් ප්‍රකාශ කළේ ය. වනවාසයේ දී කාමමඤ්ජරී සසර කලකිරුණු තැනැත්තියක මෙන් වතාවත් කොට තවුසා සන්තෝෂ කළා ය. ආදරය නිසා ඇගෙන් තොර ව ජීවත් වීමට නො හැකි වූ බැවින් මරීචි මුනිවරයා ඇය ව යානයක නංවා සිය ගෙට

ගෙන ගියේ ය. "කාමෝත්සවය හෙට" යයි ප්‍රසිද්ධ කොට කාමුක පුරුෂයකුගේ විලාසයෙන් මරීචි මුනිවරයා සමග රජ භවනට ගිය කාමමඤ්ජරී රජතුමා විසින් පිළිගන්නා ලදි. කාමමඤ්ජරීට සතුටු වූ රජතුමා ඇයට තෑගි දුන්නේ ය. කාමමඤ්ජරී මරීචි මුනිවරයාගේ දෙපා වැඳ තවුස්දම් පුරණ පිණිස ඉල්වූවා ය. වේදනාවෙන් පීඩිත වූ මරීචි මුනිවරයා අනුරාගය ගැන ප්‍රශ්න කරන විට ම ඇය රාජ සභාවේ දී තමාට මිටි වූ තරුණිය පෙන්වා විවාදයක දී සිදු වූ කථාවක් නිසා මෙසේ කළා යයි කීවා ය. මේ විනාශයට පත් මරීචි නම් තමා බව පවසා ටික දිනක් පමා වීමට අපහාරවර්මන්ට නියෝග කළේ ය. එදින රෑ අසපුවෙහි ම නිදා නුවරට යන අපහාරවර්මන්ට ජෛන අසපුවක හඬමින් සිටි තවුසෙකු මුණගැසුණේ ය. හැඬීම පිළිබඳ ඇසූ විට චම්පා නුවර නිධිපාලිත සිටාණන්ගේ වැඩිමහල් පුතා ධනපාති බවත් ඔහු විරූපක නම් විකට නමකින් ප්‍රසිද්ධ ව සිටින බවත් කීවේ ය. සුන්‍දරක යයි තරුණයෙක් ද මෙකල සිටියේ ය. ඔවුන් දෙදෙනා නිසා "ධනවතා ද රූපවතා ද වඩා උසස්" යන වාදයක් ඇති විය. එහි දී කාමමඤ්ජරීගේ සතුට ඇති කරන අය ම වඩා ශ්‍රේෂ්ඨ යයි ප්‍රකාශ කළේ ය. ඇය විරූපකට කැමති වූවා ය. ඔහු සියලු වස්තුව පාලනය කිරීමට ගණිකාව පත්කොට විවාහ වී ටික දිනකින් හැදිවතට පමණක් හිමියෙක් වී ඒ නිසා අකමැත්තෙන් ම ජෛන සාධුවරයෙක් ව වසන බවත් කීවේ ය. මෙය අසා අපහාරවර්මන් මේ ධනය ධනපාලිතට ලබා දීමට ගිවිස ගෙන ඒ නුවරට ගියේ ය. බොහෝ ලෝභී ජනයාගෙන් ඒ නගරය පිරී තිබුණි. මොවුන්ගේ ධනය සොරා ගැනීමට සිතාගත් අපහාරවර්මන් සූදු පොළකට ගොස් ඒ ක්‍රීඩාව නරඹමින් ම එකකුගේ අදක්ෂකම දැක සිනාසුණේ ය. එයින් කිපුණු සූදුකාරයා සූදුව සඳහා අපහාරවර්මන් කැඳවීය. ඔහු සූදුවෙන් රන් කාසි දහසය දහසක් දිනුවේ ය. සූදු නායකයාට හා සූදුකාරයන්ට කොටසක් දී ඔවුන් සතුටු කළේ ය. විමර්දක ඔහුගේ මිත්‍රයෙක් විය. නගරයේ සියලු තොරතුරු ඔවුන්ගෙන් දැන එදින ම රාත්‍රි ධනවතකුගේ ගෙයක් බිඳ සියලු ධනය පැහැරගත් අපහාරවර්මන් මහරෑ හුදකලා ව යන තරුණියක දැක ඇගෙන් ප්‍රශ්න කළේ ය. තමා කුබේරදත්ත සිටාණන්ගේ දූ කුලපාලිකා බවත් කුඩාකල ධනමිත්‍ර විවාහ කිරීමට ගිවිසගෙන ඔහුගේ දුප්පත් බව නිසා අර්ථපති නම් ධනවත් තරුණයෙකුට හෙට විවාහ කිරීමට කටයුතු යොදා ඇති බවත් ඒ නිසා ම තමාගේ හිමියා විය යුතු ධනමිත්‍ර ළඟට යන බවත් පැවසුවාය. අපහාරවර්මන් ඇය සනසා ඇය සමග ධනමිත්‍රගේ ගෙදර යනවිට නගරාරක්ෂක (පොලිස්) භටයන් දුටුවේ ය. අපහාරවර්මන්ගේ ඉඟැන් වීමෙන් "මාගේ මේ සැමියා නයකු විසින් දෂ්ටකර ඇති බැවින් ඔහු සුවපත් කරන්නැයි" කුලපාලිකා පැමිණ භටයන්ගෙන් උපකාර ඉල්ලුවා ය. ඔවුනතර වූ විෂ වෙදෙක් ඔහු පරීක්ෂා කොට මළ බව පවසා ගියේ ය. අපහාරවර්මන් නැගිට ධනමිත්‍රගේ ගෙට ගොස් කුලපාලිකා බාර දුන්නේ ය. විදේශ ගතවීමට අදහස් කළ ඔවුන් දෙදෙනා එයින් වළක්වා එම රාත්‍රියේ කුලපාලිකා ඇගේ ගෙට ගොස් ඇගේ ම ඔත්තු අනුව එම ගෙයි සියලු ධනය සොරකම් කළේ ය. පසුදින වික්ෂිප්ත කුබේරදත්ත අර්ථපතීන් විසින් දෙන ලද ධනයෙන් සැනසුණේ ය, විවාහොත්සවය මසකට කල් දැම්මේ ය. අපහාරවර්මන් සොරබඩු තැනක තබා ධනමිත්‍ර සමග යන්නේ ආරක්ෂක භටයන් එනු දුර දී දැක මග අසල වූ ඇතකු දැක ඇත්ගොව්වා ඇද දමා ඌ පිට නැග ආරක්ෂක පුරුෂයන් මරා පැන ගියේ ය.

අපහාරවර්මන්ගේ ඉගැනුම් බසින් ධනමිත්‍ර අංග රජු ඉදිරියට ගොස් මෙසේ කීවේ ය. මම වසුමිත්‍රගේ පුත්‍ර ධනමිත්‍ර යි. යාචකයන්ට වස්ත්‍ර දීමෙන් දිළිඳු වීමි. එබැවින් කුවේරදත්ත කුලපාලිකා මට නො දී අත්‍ථපතීට දෙනු සඳහා තීරණය කළ නිසාවෙන් කලකිරී සිය දිවිනසා ගැනීමට සූදානම් වෙත් ම සිද්ධතාපසයෙක් ඒ ක්‍රියාව වළක්වා ධනය ප්‍රසූත කරන සම්පසුම්බියක් (චර්මරත්නය) මට පරිත්‍යාග කළේ ය. මෙයින් ප්‍රයෝජන ගත යුතු ක්‍රමය කියා දී ඔහු ගුහාවකට පිවිසියේ ය. කාමරූප දනව්වල ටිකකලක් සිට මිනිසුන්ට කැමැති දෑ දුන්නෙමි. මේ පසුම්බිය නුඹ වහන්සේට නො දන්වා පරිභෝග කිරීම නුසුදුසු ය. එසේ ම මෙය සොර සතුරන්ට හසු නො වන සේ රැකීම නුඹවහන්සේ සතු වේ. රජතුමා මේ ඉල්ලීම පිළිගත්තේ ය. සොරාගත් දෑයෙන් මේ පසුම්බිය පුරවත් ම ධනමිත්‍ර පොහොසතෙක් විය. කුවේරදත්ත තම දියණිය ඔහුට පාවාදීමට නැවතත් සතුටු විය. අත්‍ථපති ඒ බව දැන වැළැක්වීමට උත්සාහවත් විය. කාමමඤ්ජරීගේ සොහොයුරිය වූ රාගමඤ්ජරී නෘත්‍යයක් රඟ දක්වූවා ය. අපහාරවර්මන් ධනමිත්‍ර සමග මේ නෘත්‍ය බැලීමට ගියේ ය. ඇය කෙරෙහි නෙත් සිත් ඇලුණි. රාගමඤ්ජරී ද අපහාරවර්මන් කෙරෙහි ඇලුණා ය. ඇගේ සහෝදරිය හා මෑණියනුත් මොවුන්ගේ සම්බන්ධය වැළැක්වීමට උත්සාහ ගත්තෝ ය. රජතුමාට ද ඒ බව දැන්වූහ. කාමමඤ්ජරීට ධර්මරක්ෂිතා නම් මිත්‍ර ශාක්‍ය භික්ෂුණියක් සිටියා ය. ඇය ලවා ධනමිත්‍රගේ වස්තු ප්‍රසව කරන සම්පසුම්බිය සොරකම් කොට කාමමඤ්ජරීට දීමට පොරොන්දු වී එසේ කළ පසු ආවාහය සිදු වන බව ප්‍රකාශ කළා ය. අපහාරවර්මන් මිත්‍ර විමර්දක අත්‍ථපතිගේ යාළුවකු කොට සම්පසුම්බිය එක් රැයකින් අතුරුදහන් වූ බවට නිලධරයන් ඉදිරියෙහි ප්‍රකාශයට පත් කෙරෙව්වේ ය. ධනමිත්‍ර රජුට මේ සොරකම ගැන පැමිණිලි කොට අත්‍ථපතී ගැන ද සැළ කළේ ය. මේ අතර අපහාරවර්මන් විමර්දක උදේනි නුවරට පිටත්කර යැවී ය. රජ ඔහු නො දැක අත්‍ථපති සිරභාරයට ගත්තේ ය. කාමමඤ්ජරී වස්තු ප්‍රසවය සඳහා ළඟ වූ ධනය විරූපක ආදීන්ට දුන්නී ය. කාමමඤ්ජරී මත ද සම් පසුම්බි සොරකම ගැන සැක කළේ ය. දිවි යතත් තමා සම්බන්ධ ව නොකිය යුතු බවට ඇගෙන් අපහාරවර්මන් පොරොන්දු ගත්තේ ය. අත්‍ථපතිගෙන් එය ලැබුණු බැව් ඇය පවසත් ම රජු විසින් අත්‍ථපතිගේ දිවි තොර කරවීමට කටයුතු කරවන ලදී. ධනමිත්‍රගේ ඉල්ලීම අනුව දිවිතොර නො කර පිටුවහල් කිරීමටත් ධනය රාජසන්තක කිරීමටත් රජ අනු දත්තේ ධනමිත්‍ර-කුලපාලිකා විවාහය උත්සව ශ්‍රියෙන් සිදු කෙරුණි. රාගමඤ්ජරී හා සුවසේ විසූ අපහාරවර්මන් දිනක් සුරාවෙන් මත් ව ප්‍රියාව එපා කියද්දී නගරය ම සොරකම් කිරීමට කඩුවකුත් ගෙන පිට වී යනවිට ශෘගාලිකා නම් උපමවක් ඔහු පසුපස පැමිණියා ය. ආරක්ෂක පුරුෂයන් සමග යුද කළ අපහාරවර්මන් ඔවුන් දෙතුන් දෙනෙකු මරා බිම වැටුණේ ය. එකල ඔහු සිරභාරයට ගත්හ. මදයෙන් තොර ව කල්පනා කොට ශෘගාලිකාවට රාගමඤ්ජරීත් ධනමිත්‍රත් සම්බන්ධ කොට දොස් කීවේ ය. මැහැල්ල ආරක්ෂ පුරුෂයන්ට මොහු උමතු රෝගයකින් පෙළේ යයි දන්වා මෙයින් බේරීමට දෙදෙනා කුමන්ත්‍රණය කළහ. පසු ව සිර ගෙයි දැම්මේ ය. අපහාරවර්මන්ගේ ඉගැන්වීම අනුව ධනමිත්‍රගේ කටින් රජුට කරුණු කීම ශෘගාලිකා අතින් සිදුවූවා ය. එබැවින් රාගමඤ්ජරී හා ධනමිත්‍ර දෙදෙනා අපහාසයට පත් නොවිණි. කාන්තක නම් තරුණ බන්ධනාගාර අධ්‍යක්ෂවරයා අපහාරවර්මන්ට තර්ජනය කළේ ය. අපහාරවර්මන්,

අම්බාලිකා නම් රජ දුව හා සම්බන්ධය මඞ්ගලිකා මාර්ගයෙන් ඇති කරවා ගත්තේ ය. කරන ලද උපහාසයකින් රැවටුණු කාන්තක, අම්බාලිකා ලබා ගැනීමට චෞර අපහාරවර්මන් ලවා උමගක් කැරවීය. අපහාරවර්මන් එහි දී කාන්තක මරා කන්‍යා අන්තඃපුරයට වැද නිදිගත් අම්බාලිකා හා මුදුමාරු කොට නික්ම ගියේ ය. පසුපස ආ ආරක්ෂකයන් වංචාකොට රාගමඤ්ජරී ගෘහයට ගොස් සැනසිණ. මේ අතර මරීචි මුනි තෙම දිවැස් ලබා සිංහඝෝෂ කාන්තකගේ අධිකාරයට පැමිණීමෙන් පසු, අම්බාලිකා හා සංගමය අපහාරවර්මන් කළේ ය. චණ්ඩවර්මන් රජු ඇය පතා ඇගේ පියාට විරුද්ධ ව රට අල්වා ගෙන අම්බාලිකා හා විවාහය උදෑසන ම නියම කළේ ය. අපහාරවර්මන් මේ අවස්ථාවේ පැමිණ අම්බාලිකාගේ අත ගැනීමට සූදානම් වත් ම කිනිස්සකින් ඇන මරා පැමිණි අනෙක් අයත් යම පුරයට යවා හැසිරෙන විටැ රාජවාහන රජතුමාගේ ගැඹුරු කටහඬ ඇසී එක් වී ගියේ ය.

**උපහාරවර්මන් - තෙවන උච්ඡ්වාසය.**

එක් දිනක් උපහාරවර්මන් මියුලු නුවර අසපුවකට ගියේ ය. තාපස කාන්තාවගේ උපස්ථාන ලැබුවේ ය. ඇය හැඬීමට පටන් ගත් බැවින් ඊට හේතු විමසීමෙන් පසු මෙසේ කීවා ය. ''මාලව මගධ යුද්ධ අවස්ථාවෙහි මියුලු රජුගේ අගමෙහෙසිය දරුවන් සමග මිතුරා බැලීමට පැමිණ ආපසු යනවිට කැලෑ පාරක දී වැද්දන් අතට පත්වූවා ය. දැන් තාපසියක් වන මම ඒ රජුගේ බාල පුත් කුමරා වඩාගෙන සිටියෙමි. වැද්දන්ගේ ඊ පහරින් බිය ව වනගත වූයෙමි. ව්‍යාඝ්‍රයකුගේ නිය පහර නිසා වැටුණු මගේ අතින් කුමරා ගිලිහී ගෙරිකුණක ඇලුණේ ය. ගොපලු ගෙදරක නවාතැන් ගත් මම තුවාළ සුව කොට ගත්තෙමි. කිසියම් තරුණයකු සමග පැමිණි මගේ දුව මට මුණගැසුණා ය. අගේ අතේ සිටි රජ කුමරු ද වැද්දන්ට අසු වූ බව කියන ලදි. වැදි තරුණයකු විවාහ වීමට යෝජනා කළ විට එයට විරුද්ධ වූ මගේ දුව මැරීමට ඔහු උත්සාහ කරන විට ම තරුණයා විසින් ඔහු මරා දමන ලදි. රජ හා බිසව සිරභාරයට ගත් නිසා මම තපස් රකිමියි.'' යනුවෙනි.

උපහාරවර්මන් රහස හෙළි කරමින් ඒ කුමරා තමා බව පැවසී ය. සතුටට පත් තාපසිය කුමාරයාට සංග්‍රහ කළා ය. එදින රාත්‍රියේ නිදියහනට ගිය උපහාරවර්මන් විකටවර්මන් විනාශ කරන ක්‍රමයක් සිතුවේ ය. ස්ත්‍රීන්ගේ උපකාරයෙන් එය කිරීමට තීරණය කරගත්තේ ය. පසු ව ඔහු අන්තඃපුර විස්තර තාපසතුමියගෙන් ඇසුවේ ය. මේ අවස්ථාවේ දී පුෂ්කරිකා අහඹු ලෙස එහි පැමිණියා ය. ඇගෙන් කල්පසුන්දරී ගැන දැනගෙන ඇයට අනුගමනය කළ යුතු ක්‍රම කියා දුන්නේ ය. විකටවර්මන් කෙරෙහි තරහත් උපහාරවර්මන් කෙරෙහි ස්නේහයත් වර්ධනය වන අයුරින් පුෂ්කරිකා කටයුතු කළා ය. තවුසිය ද ඒ සඳහා යෙදවී ය. ටික දිනක් යත් ම කල්පසුන්දරී මොහු කෙරෙහි ආදරයෙන් බැඳුණා ය. උපහාරවර්මන් සිය රූපය ඇඳ කල්පසුන්දරීට යවන ලදි. චිත්‍රය දැකීමෙන් වශී වූ ඇයට උපහාරවර්මන් දැකීමේ ආශාවක් ඇති විය. තවුසිය ඇගේ අදහස ස්ථිර කිරීමට අද ම ඔහු මුණ ගැස්විය හැකි බවත් ඒ සඳහා සලකුණක් කළ යුතු බවත් ගෞරව සහිත ව දැන් වූවා ය.

"මේ විකටවර්මන් කාමශාස්ත්‍රය ගැන දන්නා අධමයෙකි. අන් ස්ත්‍රීන් කරා යන්නෙකි. ඔහුට ම අපකීර්තිය ළඟා කර දීමට මා හමුවේ ම ඔහුගේ දුවක් හා සමාන රමයන්තිකා හා රමණය කළේ ය. එහෙයින් මේ (චිත්‍රගත) කුමරා යොහොඹුලිය (දෑසමන් ගොමුවෙහි) මඩුල්ලෙහි දී සම්මුඛ කරවයි" යි කල්පසුන්දරී කීවා ය. උපහාරවර්මන් පරඹුවන් සමීපයට යෑමට මැළි වුවත්, අර්ථසිද්ධිය ගැන සිතමින්, එසේ ම මිතුරන්ගේ අවඥාව ගැන සිතමින් නිදිගත්තේ සිහිනයක් දුටුවේ ය. ගණදෙවියන් පෙනී සිට මේ සිතුවිල්ලෙහි නිදොස් බව කීයෙන්, නියමිත පරිදි, කල්පසුන්දරී එහි පැමිණෙන විට උපහාරවර්මන් සැගැවී සිටියේ ය. ඔහු නො දැකීමෙන් කම්පා වූ ඇය සනසා මල් යහනෙහි සතුටු විය. වියෝවීමට නො කැමැති ඇයට මෙසේ කීවේ ය. චිත්‍රිත රූපය රජුට දක්වා තවුසියක් මෙහි දී අමාවක දිනක රාත්‍රි ගිනිදෙවියාට හෝම පූජා පවත්වා, සණ්ටාවෙන් සිය සැමියා කැඳවා, රහස් කී කල්හි මේ රූපය ලබා ගත හැකි ය. කල්පසුන්දරී රජුටත් පෙරවි බමුණන්ටත් මෙය කීවා ය. සියල්ලෝ ම එය අනුමත කළහ. දිනය පැමිණියේ ය. යාගය පිළියෙළ විය. මහජනයා පිටත එක්වූහ. උපහාරවර්මන් පැමිණ දේවිය යයි සැකකොට, ප්‍රශ්නවලට පිළිතුරු දුන්නේ ය. ඔහු මේ රහස් කරුණු සතර එළි කළේ ය.

1. සිර කළ ප්‍රහාරවර්මන් රජු මරවා, අජීර්ණරෝගයකින් මළේ යයි පැතිරවීම.
2. විශාලවර්මන් සහෝදරයාට යුද සෙනඟක් දීමට තීරණය කිරීම.
3. පාෂණ්ඩක පරිත්‍රාත දෙදෙන හා යෝනයකුගෙන් වටිනා මැණිකක් අඩු මිලට ගැනීමට සිතීම.
4. ශතහලි ජනපදවාසීන් කුපිත කරවා මැරවීමට සිතීම.

ඊට පසු මොහොතකින් යම පුරයෙහි ගින්නක් පැතිර වීය. මන්ත්‍රානුභාවයෙන් සිද්ධ රූ ඇත්තකු සේ මෙහෙවරකම් කියා කල්පසුන්දරී සමග නිදාගෙන අලුයම මැතිසබයට ගොස් රහස් එළිකොට පියා රජ තනතුරෙහි පිහිටුවා යුවරජ බව ලබාගත්තේ ය.

**අර්ථපාල - හතරවන උච්ඡ්වාසය.**

එක් දිනක් අර්ථපාල මණිකර්ණිකා නදිය අසල ඊශ්වර දෙවියන්ට පූජා පවත්වමින් සිටියි. ඇඳුමින් හිර ව ඉදිමුණු සිරුරක් ඇති පුරුෂයකු දැක උපකාර කිරීමට සිතා හේතු ඇසුවේ ය. ගසක් යට වාඩි වී සිටි පූර්ණභද්‍ර නමින් හඳුන්වන ඒ මිනිසා මෙසේ කීවේ ය. පෙර තමා සොරෙක් බවත්, සොරකමින් අසු ව දඬුවමට නියමිත ව මෘත්‍යුවිජය ඇතු ලවා මැරවීමට සූදානම් වුවත් හස්තියා බියෙන් පැනගිය බවත්, කාමපාල ඇමැති මේ කරුණු දැක ඔහුට සේවාව කිරීමට කී බවත් හෙළි කළේ ය. මිත්‍ර වූ මට කාමපාල ඇමැති රහසින් ඔහුගේ අතීතය ද විස්තර කළේ ය. කාමපාල දෙමාපියන්ට අවනත නො වූවෙකි. කාශි රටට ගිය මොහු කාන්තිමතී නම් රජ දුව දැක ආලය කොට කන්‍යා අන්තඃපුරයට ගොස් කල් ගෙවන විට කාන්තිමතීට පුතෙක් ලැබිණ. ඇගේ යෙහෙළියන් විසින් ක්‍රීඩා පර්වතයෙන් පෙරළන ලද බිළිදා එක්තරා වැදි

අඟනක විසින් ගෙන යනවිට ආරක්ෂක භටයන්ට අසුවිය. ඇගේ උපදේශකත්වයෙන් නිවාස අඩස්සියේ සිටි කාමපාල ඇතකු ලවා මැරීමට සූදානම් වෙත් ම ආරක්ෂකයන් මරා වනගත විය.

වනයෙහි දී යක්ෂ කන්‍යාවක් ඔහුට සංග්‍රහ කළා ය. තාරාවලී නම් ඇය එක් ආත්මයක දී ඔහුගේ භාර්‍යාව වූවා ය. ඇගේ උදව්වෙන් චණ්ඩසිංහ රජුගේ යහන් ගැබට ගොස් කඩුව ගෙන ඔහු නැගිටුවා මරණ බවට තර්ජනය කළේ ය. දෙපා ළඟ වැටී චණ්ඩසිංහ සමාව ඉල්ලා සිටියේ ය. පසු ව කාන්තිමතී ඔහුට දී යුව රජකම ද ලබා දුන්නේ ය. චණ්ඩසිංහ හා චණ්ඩඝෝෂ පරලොව ගිය කළ තාරාවලී සිංහඝෝෂ හදා වඩාගෙන ඔහු අභිෂේක කොට රාජ්‍ය පාලනය භාර කළා ය. දුෂ්ට ඇමැතියෝ රජුට කේලාම් කියා කාමපාල මැරවීමට කුමන්ත්‍රණය කළහ. එහෙත් සිංහඝෝෂ තාරාවලී නිසා එසේ කිරීමට උත්සුක නොවී ය. මේ අතර යක්ෂ කන්‍යාව යම් කිසි කටයුත්තක් නිසා ඔහු සමග කලකිරුණා ය. මේ දැනගත් සිංහඝෝෂ කාමපාල සිරකොට ඇස් උපුටාලීමට අණ කළේ ය. එබැවින් මාගේ ස්වාමී වූ කාමපාල ඇමැතිට පෙර මැරෙන්ට පූර්ණභද්‍ර සූදානම් යයි කීවේ ය.

පූර්ණභද්‍රගේ මේ කථාව ඇසූ අර්ථපාල තමා කාමපාලගේ පුතා බව ප්‍රකාශ කොට පියා මුදා ගැනීමට සිතුවේ ය. එකෙනෙහි ම කළු නයකු දැක ඔහු අල්වාගෙන පියාට දෂ්ට කරවා මන්ත්‍ර බලයෙන් සුවපත් කිරීමටත් ඒ බැව් සිය මෑණියන්ට දන්වන ලෙසත් පූර්ණභද්‍රට කීවේ ය. මෙසේ නියමිත අවස්ථාව පැමිණෙත් ම අර්ථපාල වධකස්ථානය අසල ඇති විශාල සියඹලා ගසට නැග වධයට සූදානම් කළ පියාගේ වරද හඬනගා වධකයා විසින් කියත් ම නයා පියාගේ ඇඟ මත හෙළී ය. පියාටත් වධකයාටත් දෂ්ට කළ සර්පයා පළා ගියේ ය. කාන්තිමතී රජුගෙන් අවසර ගෙන බැහැර වූවා ය. අර්ථ පාල මන්ත්‍ර බලයෙන් හා බෙහෙත් බලයෙන් පියා සුවපත් කළේ ය. පුත්‍රයා හඳුනාගත් දෙමාපියෝ සතුටු කඳුලු හෙළූහ. රජතුමා නැසීමට කාමපාලත් කාමපාල නැසීමට රජුත් නොයෙක් උපක්‍රම යෙදවී ය.

මෙසේ පවත්නා අතර අර්ථපාල සිය නිවසෙහි සිට රජ මැඳුරට පිවිසීමට උමඟක් හැරවී ය. මේ උමඟ කන්‍යා සමූහයක් විසූ කන්‍යා ලෝකය දක්වා දික් විය. ඒ ස්ත්‍රීහු තැති ගත්හ. ඔවුන්ගේ මහලු ස්ත්‍රිය අර්ථපාලට වැඳ තොරතුරු විචාළා ය. අර්ථපාල තමා කාන්තිමතීගේ පුත්‍ර අර්ථපාල බවත් රජගෙදරට යන බවත් කීවේ ය. මැහැල්ලිය සතුටු ව මණිකර්ණිකා නම් චණ්ඩඝෝෂ දුවණිය ආවාහකර ගන්නා ලෙස ඉල්ලා සිටියා ය. භූමිගත ගෘහයෙහි අවුරුදු 16 මේ ස්ත්‍රීන් තැබුයේ දර්පසාරට මැය දීමට ය. අර්ථපාල මැහැල්ල දැක් වූ මගින් සිංහඝෝෂගේ කාමරයට වැද දම්වැලෙන් බැඳ කාමපාල වෙතට ගෙනාවේ ය. පසු ව මණිකර්ණිකා අර්ථපාලට විවාහ කර දුන්නේ ය.

**ප්‍රමති - පස්වන උච්ඡ්වාසය.**

දිනක් සවස ප්‍රමති රාජවාහන සොයමින් වින්ධ්‍යා පර්වතයට පැමිණ කොළ යහනක් සාදා ඒමත දෙවියන් පිහිට ඉල්ලා නිදා ගත්තේ ය. සුළු මොහොතක් ගත වනවිට දිව්‍ය ස්පර්ශයකින් ඇස හා සිත පිනා ගියේ ය. අවට නිදා සිටින සුරූපී ලඳුන් ද

ඔහුගේ දකුණු පසින් සිටි රමණීය රූ සපුවෙන් යුත් තරුණියක ද දැක පුදුම විය. ඔවුන් මනුෂ්‍ය ස්ත්‍රීන් බව දැනගෙන ම නැවත නිදා ගත්තේ ය. රළු ස්පර්ශයකින් අවදි වී අවට බලන විට මහා වනය දුටුවේ ය. එහෙත් ඇත්ත නැත්ත නොදැන නො නැගිටිමි යි සිතා නැවැත නිදාගත්තේ ය. මේ අවස්ථාවෙහි තාරාවලී එහි පැමිණ තමාගේ තත්ත්වය කියා කාමපාල හා කිපීම නිසා යක්ෂයකු විසින් තමාට ශාපයක් කළ බව පැවැසුවා ය. පුරා වර්ෂයක් ම විරහදුක විඳි බවත් ශාපය අවසානය එදින බැවින් ඊශ්වර පූජාවට යෑමට සූදානම් වූ ආකාරයත් ඔබගේ ඉල්ලීම ඇසීම නිසා සැවැත් නුවර ධර්මවර්ධන රජුගේ දියණිය වූ නවමාලිකාගේ යහනෙහි නිදිකරවා පූජාවට ගිය අයුරුත් පවසා සිටියා ය. පසු ව ඇය කාමපාල ඇමැති වෙතට ගියා ය. සැවැත් නුවර යන ප්‍රමති නියම් ගමක වෙළඳුන් විසින් මෙහෙයවන කුකුළු පොරයක් දුටුවේ ය. අසමාන කුකුළන් පොරට යොදා ඇති බව දැක ප්‍රමති සිනහ විය. සූදුකාර මහලු බමුණෙක් එය දැක සිනහවට කරුණු විචාළේ ය. කරුණුවලින් පැහැදුණු ඔවුහු දෙදෙන මිත්‍ර වූහ. බමුණා ඔහුට ආහාරවලින් ද සංග්‍රහ කළේ ය. ප්‍රමති නවමාලිකා සෙවීමට සැවැත් නුවරට ගියේ ය. ගමන් වෙහෙස නිසා උපවනයෙහි නිදාගත්තේ ය. ටික වේලාවකින් අවදි වූ ඔහු තරුණ කාන්තාවක දුටුවේ ය. ප්‍රමති ඇය හා පිළිසඳර කථා කළේ ය. ඇය අත සිතියමක් විය. සිතියම දෙසත් ප්‍රමති දෙසත් බලමින් ප්‍රමති ඈ අතින් සිතියම රැගෙන එහි වූ තමාගේ රූපය අසලින් ව්‍යාජ නිදිගත් තරුණියක ඇන්දේ ය. මෙය සිහිනයක් බව ද කීවා ය. ඇගේ සංග්‍රහ විඳ නවමාලිකා හමුවට ටික දිනකින් ම පැමිණෙන බව පවසා මහලු බමුණා හමුවීමට ගියේ ය.

ඒ බමුණා විසින් ප්‍රමති ගෞරවයෙන් පිළිගෙන පෙරළා පැමිණීමේ හේතු විචාළේ ය. ප්‍රමති නවමාලිකාත් ඇගේ රූපලාවණ්‍යයත් අතිශයින් වර්ණනා කොට ඇය හා එක්වීමට බමුණාගේ උපකාර ඉල්ලී ය. සතුටු වූ බමුණාට මෙසේ කීවේ ය. මම ස්ත්‍රී වෙස් ගෙන ඔබගේ දුව මෙන් සැරසෙමි. එවැනි මා හා ධර්මවර්ධන රජුවෙත ගොස් එක ම දුව මේ යයි මා පෙන්වා මැය ආවාහ කර ගැනීමට ගිවිසි අවන්තියෙහි ශාස්ත්‍ර හදාරණ තරුණයා කැඳවා පැමිණෙන තුරු රැක ගන්න යයි කියයුතු ය. රජතෙම මෙය පිළිගනියි. එවිට නවමාලිකා හා රිසිසේ හැසිරෙමි. ලබන මැදින් මස පැවැත්වෙන ජලක්‍රීඩා දිනයෙහි නැගෙනහිර කඳ කුමරු දේවාලයෙහි සුදු වස්ත්‍ර දෙකක් ගෙන පැමිණ සිටිය යුතු ය. එහි දී මම ඔබගේ බෑණා වෙමි. රජුවෙත ගොස් දියණිය භාරදෙන සේ ආයාචනා කළ යුතු යි. බමුණා ද මෙම කපටි ක්‍රියාවලිය මැනවින් ඉටු කළේ ය. නවමාලිකා ප්‍රමතිගේ වියෝගයෙන් වැළපෙන්නී ය, රජතුමා මහලු බමුණා සැනසීමට නොයෙක් දේ කීවේ ය. අන්තිමේ දී දරසෑයක් කරවා එහි පැන දිවි නසා ගැනීමට සූදානම් වත් ම සිය දියණිය වන නවමාලිකා තරුණ බ්‍රාහ්මණ වේශයෙන් පැමිණි ප්‍රමතිට විවාහ කොට දුන්නේ ය.

**මිත්‍රගුප්ත - භයවන උච්ඡ්වාසය.**

සුහ්ම ප්‍රදේශයේ දාමලිප්ත නගරයෙන් පිටත උපවනයෙහි මහත් උත්සවයක් ඇති අවස්ථාවෙහි වීණාවක් වයමින් හුදෙකලා ව සතුටු වෙමින් තම සිතෙහි ආකුල බව සැහැල්ලු කරගනිමින් සිටින කෝශදාස නම් තරුණයකු දැක ඔහුගෙන් ඇසුවේ

ය. සොඳුරු තැනැත්ත, උත්සවයේ නම කුමක් ද? ආරම්භ කළේ ඇයි? උත්සවයෙන් කුමක් බලාපොරොත්තු වේ ද? ව්‍යාකූල භාවයෙන් කුමක් නිසා හුදකලාව වීණාවත් සමග සිටිහි ද? සුහ්මාධිපති තුඞ්ගධන්වන් දරුවන් නැත්තෙකි. මෙම දේව මන්දිරයෙහි වාසය කරයි. එහි දී දුගී දේවියගේ දෙපා නමැද දරුවන් දෙදෙනෙක් පැතුවේ ය. උපවාසයේ ද යෙදුණේ ය. එයින් දරු දෙදෙනෙක් ලැබුණා හ. කාලි දේවිය සතුටු කිරීමට අවුරුදු පතා කන්‍දුක උත්සවයක් පැවැත්වීමට සිදු ව තිබුණි. මේ උත්සවය එය යි. කෝශදාසගේ ප්‍රියාව චන්‍ද්‍රසේනා ය. ඈ හා ආවාහ වීමට නො හැක්කේ භීමධන්වන් ඇය පිළිබඳ සිතන බැවිනි. එනිසා දිවි තොරකර ගැනීමට සූදානම් යැයි කෝශදාස කියත් ම චන්‍ද්‍රසේනා එහි ළඟා වූවා ය. ඇය සිය වල්ලභයාට විදේශ ගතවීමට යෝජනා කළා ය. චන්‍ද්‍රසේනා මිත්‍ර ගුප්තටත් කෝශදාසටත් ආරාධනය කොට එහි ගියා ය. කන්‍දුකාවතී කුමරිය ක්‍රීඩා කරමින් ම මිත්‍ර ගුප්ත දෙසත් ක්‍රීඩා බලමින් මිත්‍රගුප්ත කන්‍දුකාවතී දෙසත් අනුරාග ඇසින් බැලූහ. කන්‍දුකාවතීගේ අදහස චන්‍ද්‍රසේනා මාගීයෙන් රජුට සැළ විය. මිත්‍රගුප්ත හා කෝශදාසත් මේ මාගීයෙන් ම දැන සන්තෝෂ වූවාහු ය.

දෙවැනි දා උදය භීමධන්වන් කුමරාට මිත්‍රගුප්ත හමු වී සම්මාන කොට (භොජනාදියෙන්) සිය මාලිගයට ආරාධනා කැරිණ. මැනවින් සංග්‍රහ විඳි මිත්‍රගුප්ත සැතපුණේ ය. ක්ෂණයකින් හැකිලි දමා, අවඥාවට ද පත්කොට මුහුදට බැස්සේ ය. වාසනාවකට මුහුදෙහි දී කොටයක් ලැබී එහි එල්ලී සිටින විට යෝනක නැවත් ළඟා විය. යෝනකයෝ මිත්‍රගුප්ත බේරාගත්හ. ඇසිල්ලකින් විරුද්ධ නාවික හමුදාවක් යෝනුන්ට පහර දෙන්නට පටන් ගති. යෝන්නු පරාජයට පත්වූහ. එවිට මිත්‍රගුප්ත හැකිලි ගලවා යුද කොට විරුද්ධ හමුදාවේ ප්‍රධානියා ජීවග්‍රහණයෙන් අල්වා ගති. හේ අනිකෙක් නො ව භීමධන්වන් ය. ද්වීපයට ගොඩ බැස ගල්තලාවක සිටින විට රකුසෙක් පැමිණ මිත්‍රගුප්තට තර්ජනය කෙළේ ය. පණ රැක ගැනීමට රකුසාගේ ප්‍රශ්නලට පිළිතුරු දීමට මිත්‍රගුප්තට සිදුවිණි.

## රකුසාගේ ප්‍රශ්න

## මිත්‍රගුප්තගේ පිළිතුරු

1. කුමක් කුරිරු ද? ස්ත්‍රී හදවත.
2. ගිහියාට ප්‍රියවන්නේ කුමක් ද? ගුණවත් බිරිඳ.
3. කාමය කුමක් ඇති කරයි ද? ඉෂ්ටාර්ථ සිද්ධිය.
4. සාධනයට දුෂ්කර කුමක් ද? ප්‍රඥාව.

ධූමනී, ගෝමිනී, නිම්බවතී, නිතම්බවතී යන කාන්තාවන් සම්බන්ධ කථාවන් මෙම ප්‍රශ්නලට පිළිතුරු වශයෙන් ක්‍රමයෙන් නිදර්ශන ලෙස මිත්‍රගුප්ත කීවේ ය.

ත්‍රිගර්ත දනව්වෙහි දුර්භික්ෂයක් ඇතිවිය. ධනවත් සහෝදරයන් තිදෙනා ක්‍රමයෙන් සියලු දේ අනුභව කොට, බාල සහෝදරයාගේ බිරිය වූ ධූමනීය ද අනුභවයට තීරණය කරන ලදි. ධන්‍යක නම් බාල සොහොයුරා ඊට පෙරදින ඇය සමග පලාගියේ ය.

විඩාවට පත් ඇය කර තබාගෙන ගියේ ය. පිපාසයට සිය ලේ දුන්නේ ය. අතරතුර අත්පා නැති අසරණයකු දැක ඔහු ද කර තබාගෙන ගොස් පැලක වාසය කළේ ය. ටික දිනකින් කොටා ද සුවපත් විය. ආහාර සෙවීමට ධන්‍යක ගිය අතර ධූමනී බලාත්කාරයෙන් කොටා සමග සංසර්ගයේ යෙදුණා ය. මෙය ප්‍රකට වේය යන බියෙන් ගුණවත් හිමියා ළිඳක දමා කොටා කර තබාගෙන ඇවිද්දා ය. "පතිව්‍රතාව රකින කාන්තාවකැ"යි මහජන ආධාර ඇයට ලැබිණ. ධන්‍යක භාග්‍යයකින් දෝ වෙළඳුන් අතින් ගොඩට පැමිණ මැය වසන පළාතට ගියේ ය. ධූමනී, ධන්‍යක සිය හිමියාගේ දෙඅත් දෙපා කැපූ අය හැටියට පැමිණිලි කළා ය. රජු වධයට නියම කෙළේ ය. ධන්‍යකගේ ඉල්ලීම අනුව කොටා යථා තත්ත්වය ප්‍රකාශ කෙළේ ය. එකලැ ධූමනීගේ කන් නාසා කැපූහ.

කාඤ්චි පුරයෙහි ශක්තිකුමාර නම් කෝටිපතියා ගුණවත් භාර්‍යාවක පරීක්ෂා කිරීමට හාල් නැළියකුත් රැගෙන පෙදෙසින් පෙදෙසට, ශාස්ත්‍රකාරයකු සේ සංචාරය කළේ ය. කුලවත් රූපවත් තරුණියක දුටුවිට හාල් නැළියකින් භෝජනයක් පිළියෙල කර දිය හැකිදැයි අසයි. එසේ කළ හැකි යයි කී ගෝමිනී නම් තරුණියක හමුවිය. ඇය එයින් සම්පූර්ණ භෝජනයක් පිළියෙල කළා ය. ශක්තිකුමාර ඇය ආවාහ කරගත්තේ ය. තව දුරටත් පරීක්ෂා කිරීමට ගණිකාවක් තබාගත්තේ ය. ගෝමිනී මිතුරියකට මෙන් ඇයට සංග්‍රහ කළා ය. ඊට පසු සියලු ධනයට හිමිකාරී වශයෙන් ඇය පත් කෙළේ ය.

වලභී නගරයෙහි මිත්‍රගුප්ත වෙළෙන්දාට රත්නවතී යයි දුවක් වූවාය. ඇය බලභද්‍ර නම් වෙළඳ තරුණයකු හා විවාහ වූවා ය. අතිශය ලජ්ජාකාරී බැවින් විවාහ දින රාත්‍රියෙහි හිමියා ඇය අත්හළේ ය. නෑදෑ හිතමිතුරෝ ඇයට උපහාස විසින් නිම්බවතී යයි ව්‍යවහාර කළහ. නිම්බවතී තම අවස්ථාව පරිව්‍රාජිකාවට විස්තර කොට ඇය ලවා තමා හා සමාන වූ මිතුරියක වන කනකවතීගේ ගෙට බලභද්‍ර ගෙන්වා කනකවතී නාමයෙන් පැන ගියා ය. බලභද්‍ර ධනවතෙක් වී පූර්වදාසියකට දුන් දඬුවමකින් මේ රහස ඇය එළිකළ විට බලභද්‍රගේ ධනය රාජසන්තක කිරීමට සූදානම් විය. බලභද්‍ර තැවුණේ ය. එකලැ නිම්බවතී තමා කනකවතී නො ව නීතියෙන් බැඳුණු රත්නවතී ම යයි පැවසුවා ය.

මියුලු නුවර තරුණයෙක් කලාවන්හි හා ගණිකාවන් කෙරෙහි ලොල් ව විසුවේ ය. දිනක් කාන්තාවකගේ සිතියමක් දැක කාමාශාව ඇති විය. ඇය සොයා දෛවඥ වේශයක් ගෙන නිතම්බවතීගේ ගෙට ගියේ ය. වශී වූ ඔහු සොහොන් පාලකධුරයක් ලබා සොහොන් රෙදිවතින් තවුසියක මිතුරු කර ගෙන ඇය ලබා ගැනීමට උපායක් යෙදී ය. පසු ව මන්ත්‍ර ගුරුකමකින් හිමියාගේ දුර්වලත්වය නැතිකොට දරුවන් ලබන තත්ත්වයට හැරවිය හැකි ය යන කියමනට එක් වූ ඇය එය සිදු කිරීමට උත්සුක වූවා ය. තවුසියගේ කීම අනුව මන්ත්‍රකරුගේ අත උඩ පය තැබුවා ය. මන්ත්‍රකරු අන් අතින් කලවා මුල ආයුධයකින් තුවාළ කොට නූරුවලාවක් ද පන්නාගනියි. පසු දිනක අනන්තකීර්ති නම් නිතම්බවතීගේ ස්වාමියා සමීපයට මේ නූරුවලාව විකිණීමට මන්ත්‍රකරු ගෙන ගියේ ය. අනන්තකීර්ති මෙය ලැබුණු ක්‍රමය විචාළේ ය. ප්‍රසිද්ධ ස්ථානයක පවසන බැව් කීවෙන් එහි දී මෙසේ කීවේ ය. සොහොනෙහි මිනී කන

ස්ත්‍රිය අල්ලා මෙය ගත්බව හා ඇයගේ ඌරුමුල තුවාළ කළ බැව් ද කීවේ ය. මෙයින් නිතම්බවතී රකුසියක යයි සැකයෙන් හළේ ය. කපටියා සිය දිවිනසා ගැනීමට වන් නිතම්බවතීට වැඳ ඔහු හා සමග සහවාසයට තුටු කරවා ගත්තේ ය.

මිත්‍රගුප්තගේ මේ පිළිතුරුවලින් සතුටු වී ඔහුට සත්කාර කෙළේ ය. එකෙනෙහි කන්‍යාවක් හඬ ව හඬවා, ගෙන යන රකුසකු දුටුවේ ය. මිත්‍රගුප්තගේ මිත්‍ර රාක්ෂසයා අහසට පැන ඔහු හා යුද කරනවිට කන්‍යාව ගිලිහුණි. මිත්‍රගුප්ත බිම වැටීමට ඉඩ නො දී අල්ලා ගත්තේ ය. ඇය අනිකක නො ව කන්‍දුකාවතී ය. ඇයත් රැගෙන නැවු නැඟ නියමිත ස්ථානයට ගියේ ය. තුඞ්ගධන්ව රජු බිසවත් සමග දිවිනසා ගැනීමට සූදානම් ය යන ආරංචිය ලැබ එහි වහා ගියේ, කන්‍දුකාවතීත්, සිරකළ භීමධන්වත් භාර දුන්නේ ය. ප්‍රීතියට පත් රජතුමා කන්‍දුකාවතී මිත්‍රගුප්තට දුන්නේ ය. චන්‍ද්‍රසේනා කෝශදාසට ලැබිණ.

**මන්ත්‍රගුප්ත - හත්වන උච්ඡ්වාසය.**

කලිඟුරට සොහොනක් ළඟ වාඩිගත් මන්ත්‍රගුප්තට "දුජීන මේ සිද්ධයා රාගී වූ මම අණ දීමෙන්, වෙන් කරන ලද්දේ වෙමි. ශක්තිමතෙක් මොහුගේ ක්‍රියාවට අනතුරක් කරන්නේ නම් මැනවි" යන වදන් ඇසිණ. පරීක්ෂා කරත් ම මන්ත්‍ර පූරණය කරන ජටිලයකුත් ඔහුට වැඳ සිටින රකුසකුත් දුටුවේ ය. කලිඟු රට කදීන රජුගේ කනකලේඛා නම් දුව ගෙන ඊමට අණලත් රකුසා එසේ කෙළේ ය. ඇය විලාප දෙද්දී කෙස් කළඹින් අල්ලා කඩුවෙන් ගෙල කැපීමට ජටිලයා සූදානම් වෙත් ම මන්ත්‍රගුප්ත පැන කඩුව ගෙන ඔහුගේ ගෙල සින්දේ ය. රකුසා අප්‍රමාණ ස්තුති වදන් ප්‍රකාශ කොට අවශ්‍ය දෙයක් සිදු කළ හැකි බව ද කීය. එවිට මේ කුමරිය රජමැදුරට ගෙන යව යයි කියත් ම කනකලේඛා ඇය හා විසීමට මන්ත්‍රගුප්තට ඇය ද සිටියා ය. රකුසා විසින් මන්ත්‍රගුප්ත හා කනකලේඛා යන දෙදෙන කන්‍යා අන්තඃපුරයට ගෙන යන ලදි. කනකලේඛා සිය යෙහෙළියන්ට දන්වා ඔහු හා සුවසේ විසුවා ය.

වසන්ත සමයක පිරිවර සහිත කලිඟු රජ විනෝදවත් ම අඟුරට ජයසිංහ රජ විසින් අල්ලා ගන්නා ලදි. කනකලේඛා නිසා කදීන රජ නො මැරුවේ ය. නමුත් කනකලේඛා අමනුෂ්‍යාවේශයක් ඇත්තියක මෙන් හැසුරුණා ය. නොයෙක් මන්ත්‍රගුරුකම් රජු විසින් සිදුකරවන ලදි. බමුණකු අතින් සියලු පුවත් දත් මන්ත්‍රගුප්ත, මන්ත්‍රකාරයකු සේ සැරසී ශිෂ්‍යයන් පිරිවරා අඟරට විල් ඉවුරෙහි වසමින් ආශ්චර්‍ය ක්‍රියා කෙළේ ය. එසේ ම ශිෂ්‍යන් ලවා "මේ ජටාධරයා සියල්ල දනී; දැනගතයුතු ප්‍රශ්න අසා ගනිත්වා" යයි රාවය පැතිරවිය. ජයසිංහ රජුගේ කණටත් මේ ප්‍රවෘත්තිය ගියේ ය. කනකලේඛාගේ අමනුෂ්‍ය උපද්‍රවය දුරුකර ගැනීමට රජතුමා උත්සුක විය. දින තුනකින් කටයුත්ත පරිසමාප්ත කිරීමට තවුසා පොරොන්දු දුන්නේ ය. අවසාන රාත්‍රියෙහි මේ විල තුළ දී මන්ත්‍ර බලයෙන් එය කිරීමට තීරණය විය. රජය ආරක්ෂකයන් යෙදවීය. විල අභ්‍යන්තරය මැනවින් පරීක්ෂා කරන ලදි. තවුසා ද එදින ම පිටත්වන බවට ද පොරොන්දු දුන්නේ ය. රතු ඇසින් තෙත් ගතින් ගොස් කනකලේඛා බැලූ විගස ම උපද්‍රවය පහ ව යන බවට රජුගේ ද විශ්වාසය විය. නියමිත වේලාව පැමිණෙත් ම රජු දිය යටට බැස්සේ

ය. මන්ත්‍රගුප්ත කල්තියා සැඟ වී සිට සිදුරෙන් පැමිණ රජු මරා සඟවා තමා රජු හැටියට මාලිගයට ගියේ ය. පසුදා අමාත්‍යයන් හා කටයුතු කෙළේ ය. පසු දිනක කනකලේඛා යෙහෙළියක දැක ඇය මගින් මේ පුවත කනකලේඛාවට සැළ කෙළේ ය. ඔවුන්ගේ එකතුව නැවත ඇති වී අඟුරට කලිඟු රජුට ම පාවා දී රාජවාහන හමුවට පැමිණියේ ය.

**විශ්‍රුත - අටවන උච්ඡ්වාසය.**

දිනක් විශ්‍රුත රාජවාහන සොයා ඇවිදින්නේ වින්ධ්‍යවනයෙහි ළිඳක් ළඟ හඬමින් සිටි පහළොස් හැවිරිදි කුමාරයකු දුටුවේ ය. ඒ කුමරා ළිඳෙහි වැටුණු මහල්ලකු ගැන කීවේ ය. විශ්‍රුත ඔහු ගොඩගෙන දෙල් ගසකින් දෙල් කඩා සාපවස් සංසිඳුවා වෘද්ධයාගෙන් තොරතුරු විචාළේ ය. ඔහු මෙසේ කීවේ ය. විදර්භයෙහි පුණ්‍යවර්මන් රජුගේ පුත්‍ර වූ අනන්තවර්මන් යයි රජෙක් සිටියේ ය. වසුරක්ෂිත නමැති වෘද්ධ අගමැතිවරයා නීතිය ඉගෙනීමට රජුට අවවාද කෙළේ ය. රජු එය පිළිගත්මුත් විහාරභද්‍රගේ වදනින් කාමයෙහි ම ආසක්ත වී සිටියේ ය. නැවත ද අවවාද කෙළේ ය. එයින් ඔහු රජුගේ උපහාසයට ලක් වීය. මේ අතර චන්ද්‍රපාලිත හා විහාරභද්‍ර වසන්තභානුගේ මිත්‍රයන් බවට පත්කොට රජුගේ සියලු පුවත් දැන අනන්තවර්මන් හා යුද පිණිස කටයුතු යෙද වීය. භානුවර්මන් නමැති ප්‍රාදේශීය රජෙක් ඒ සඳහා ඉදිරිපත් ව යුද කෙළේ ය. භානුවර්මන් වෙනුවෙන් වසුරක්ෂිත ඇමැතිවරයා වසුන්ධරා බිසවත් භාස්කරවර්මන් කුමරුත් මඤ්ජුවාදිනී කුමරියත් රැගෙන පලායන විට අතරමග දී මළේ ය. නාලීජඞ්ඝ රජ පිරිස මිත්‍රවර්මන් වෙත ගෙන ගියේ ය. මිත්‍රවර්මන් බිසව ගැන නොමනා අදහස් සිතුවේ ය. එබැවින් භාස්කරවර්මන් රැකගැනීමට නාලීජඞ්ඝට පැවරිණ. කුමරාට දිය දෙනු සඳහා උත්සාහ කරන විට ඔහු මේ ළිඳට වැටුණේ ය.

විශ්‍රුත කුමරාගේ ප්‍රවෘත්තියෙන් අවශ්‍ය ඥාති බව දනිත් ම වැද්දෙක් ප්‍රචණ්ඩවර්මන් රජ මඤ්ජුවාදිනී ලබා ගැනීමට පැමිණේ යයි කීය. විශ්‍රුත නාලීජඞ්ඝට මෙසේ අණ කෙළේ ය. වසුන්ධරාට යථා තත්ත්වය පවසා භාස්කරවර්මන් ව්‍යාඝ්‍රයකු විසින් අල්ලා ගන්නා ලද බවත් මිත්‍රවර්මන් හා සහවාසයට වසුන්ධරා එකඟ බවත් ප්‍රකට කරවා මේ විෂ වතුරෙන් තෙමා මල්දමින් රජුගේ ළයට ගැසීමටත් ඊට පසු ඖෂධියෙන් ඉස මල්දම සිය දියණිය ගෙල පැලඳවීමටත් නියම කෙළේ ය. එය එසේ සිදුවිය, රජ යමපුරයට ගියේ ය. තවුස් වෙස්ගත් විශ්‍රුත භාස්කරවර්මන් දෙදෙනා බිසවගේ ගෘහයට ගොස් තොරතුරු දැන රහස් කරුණු කියා නාලීජඞ්ඝගෙන් ප්‍රහාරවර්මන් රජ සිටිතැන අසා ඔහු මරා පසුපස්සෙහි පැමිණි භටයනුත් මරා නිදොස් තවුස් වෙසින් සිටියේ ය.

කාලීදෙවොල ප්‍රතිමාව යට සිදුරක් කොට නාලීජඞ්ඝ ගෙනා අබරණ පැලඳ එහි තුළ විසුවා ය. ආදාහනයෙන් පසු දේවිය සහ පිරිස දෙවොල වටා රැකවරණ දී සිටියහ. පිළිමය ඔසවා පිට ව ප්‍රතිමාව එහි ම තබා රාජ්‍යය සඳහා කාලි දේවිය මේ කුමරා දේය යි ගම්භීර නාදයෙන් පැවසීය. සියල්ලෝ එය විශ්වාස කළහ. භාස්කරවර්මන් රජ වීය. විශ්‍රුත මඤ්ජුවාදිනී විවාහය වීය. ආර්‍යකේතු එහි තබා රාජවාහන සෙවීමට විශ්‍රුත පිටත් වීය. සියලු මිත්‍රයෝ ම රාජහංස රජුගේ ආඥාවෙන් පුෂ්පපුරී නගරයට ගියාහු ය.